පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - සබරගමුව

සති පාසල

විෂය- පෙරදිග සංගීතය

සතිය- 4

ශ්‍රේණිය - 9

සැකසුම - ඩබ්.එන්.ජී.චන්ද්‍රකාන්ති

ර/ නිවි/ ඇලපාත මහා විද්‍යාලය

**නිපුණතාව 1.0 - සංගීතයේ මූලිකාංග, ශිල්පාංග සහ සිද්ධාන්ත හඳුනා ගනිමින් ගායන/වාදන හැකියා ප්‍රදර්ශනය කරයි.**

**නිපුණතා මට්ටම 1 .1 - ආරෝහණයේ සහ අවරෝහණයේ විවිධ ස්වර ඇතුළත් රාග හඳුනා ගනිමින් ගායන හැකියා වර්ධනය කර ගනියි.**

**ක්‍රියාකාරකම 1.1.1 - භූපාලි රාගයේ මධ්‍යලය ගීතය**

**ඉහත 1.1.1 ක්‍රියාකාරකමට අදාළ ව සපයා ඇති අංක 01, 02, 03 පැවරුම් සම්පූර්ණ කරන්න.**

පැවරුම- 01

1. භූපාලි රාගයට අයත් පහත සදහන් මධ්‍යලය ගීත ගායනා හොඳින් ශ්‍රවණය කරන්න. ඛ්‍යාල් ගායන ශෛලිය පිළිබඳ මෙන් ම ඒවා ගායනා කරන පිළිවෙළ පිළිබඳව ද අවබෝධයක් එමගින් ලැබේ.

- https://youtu.be/wae7qMZH3j4
- https://youtu.be/ecY5JH79drY

11. මෙම ගීත ශ්‍රවණයේදී විශේෂයෙන් භූපාලි රාග අංග පිළිබඳ ඔබේ අවධානය යොමු කරන්න.

111. භූපාලි රාගයට අයත් මධ්‍යලය ගීතයේ ස්ථායි කොටස නිවැරදි ව ඔබේ අභ්‍යාස පොතේ සටහන් කරගන්න.

1v. හැකිනම් ස්වර පුවරුවක් ආධාරයෙන් හෝ ඉහත ඔබට ලබා දී ඇති link ආධාර කරගෙන නාදමාලාව තහවුරු වන තෙක් ඉතා හොඳින් මධ්‍යලය - ස්ථායී කොටස ගායනයට හුරුවන්න.

**භූපාලි රාගය - මධ්‍යලය ගීතය - ත්‍රී තාල**

**ස්ථායි**

| 0 | 3 | x | 2 |
|---|---|---|---|
| ස° ස° ධ ප | ග රි ස රි | ධ ධ ස රි | ග රි ග - |
| න ම න ක | ර ච තු ර | ගි රි ගු රු | ච ර නා s |
| ග ග ප ධ | ස° ධ ස° ස° | ස° ප ධ ප | ග රි ස - |
| ත න ම න | නි ර ම ල | ක ර භ ව | ත ර ණා s |

පැවරුම- 02 ලිඛිත

1. භූපාලි රාගයේ මේලය /ආරෝහණ/ අවරෝහණ/ වාදී/ සංවාදී /ජාතිය /මුඛ්‍යාංගය ලියන්න.

පැවරුම - 03

1. අන්තර්ජාලයෙන් .භූපාලි රාගයට අයත් ශාස්ත්‍රීය ගායන/වාදන පරිශීලනයට යොමු වන්න.